# 2023.03.14 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා වැඩ බලන ගරු සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
02.ප්‍රාදේශීය ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

<u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>

01.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
04 .ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර වැඩ බලන ගරු සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී. 2023 මාර්තු මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට වැඩ බලන ගරු සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

## I. 2023.02.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

2023.02.14 දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත්, එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)**</u>

2023.02.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)**</u>

2023.02.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

ඒ අනුව සංශෝධන නොමැති බැවින් 2023.02.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.02.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

## I. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය ගැසට් පත්‍රයේ පල කිරීම.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාවක් ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා වූ විශේෂ යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**II. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභික ධූර කාලය 19 වැනිදා අවසන් වීමට නියමිත බැවින් ගරු මන්ත්‍රී මණ්ඩලයට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා ගැනීම.**

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභික ධූර කාලය 19 වැනිදා අවසන් වීමට නියමිත බැවින් ගරු මන්ත්‍රී මණ්ඩලයට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා ගැනීම සඳහා වූ විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය විසින් ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා ස්ථිර කරන මෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය-(පො.ජ.පෙ.)</u>

වසර 5ක ධූර කාලය අවසන් කරන සභිකවරුන් හා සභිකවරියන් විදියට යම් කිසි අදහස් දැක්වීමකට අවස්ථාව ලබා ගැනීම සුදුසු බවත් එම අදහස් දැක්වීම් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවත් මම යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාර මැණිකා මහත්මිය-(පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ධූර කාලය අවසන් කරන සභිකවරුන් හා සභිකවරියන්ට යම් කිසි අදහස් දැක්වීමකට අවස්ථාව ලබාගැනීමේ විශේෂ යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ධූර කාලය අවසන් කරන සභිකවරුන් හා සභිකවරියන්ට යම් කිසි අදහස් දැක්වීමකට අවස්ථාව ලබාගැනීමේ විශේෂ යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

විශේෂයෙන්ම කොවිඩ් කාල සීමාව තුළ සභාවේ රාජකාරි කරමින් සිටි, අප අතරින් වියෝ වූ ගරු සභාපති සුනිල් ජයවීර මහතා මම පළමුවෙන්ම සිහිපත් කරනවා. ඒ වගේම වසර 5ක ධූර කාලය තුළ විවිධ අවස්ථාවන් වල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පුටුවල මාරුවීම් සිදුවුණා. ඒ අනුව අද දවසේ මම වැඩ පලන සභාපතිවරයා විදියට අද මේ සභාවේ වැඩ කටයුතු කරගෙන යනවා. ඒ වගේම මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා උප සභාපති විදියට මාව පත් කිරීමට කටයුතු කරපු ගරු මන්ත්‍රීවරුන්ට හා ගරු මන්ත්‍රීවරියන්ට. අපි සියලු දෙනාම ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරු විදියට අපිට ආවේණික දේශපාලන පක්ෂවලට අපේ සහයෝගය ලබාදෙන කණ්ඩායමක්. එනිසා ගරු මන්ත්‍රීවරු විදියට මේ ගරු සභාවට පත්වෙලා එන සෑම මන්ත්‍රී කෙනෙකුගේම බලාපොරොත්තුවක් තිබෙනවා ගරු සභාපති තනතුරට පත් වීමට.එහි කිසිම වරදක් නෑ. මම ඔබතුමන්ලාට මතක් කරන්නේ මගෙත් තිබුණා සභාපති වීමේ බලාපොරොත්තුවක්.කෙසේ හෝ අද ඒ අවස්ථාව උදාවෙලා තිබෙනවා.ඒ ගැන මම නිහතමානීව සතුටුවෙනවා. ඒ අවස්ථාව මට ලබාදුන් ඔබතුමන්ලාට නැවතත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. 1992 වර්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හරහා මම දේශපාලනයට අවතීර්ණ වුණා.2002 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයෙක් විදියට ඉදිරිපත් වුණා.2006 වර්ෂයේ රංජිත් උපාලි හිටපු සභාපතිතුමාගේ පාලන කාලයේ සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට සභාව නියෝජනය කරනවා.එතැන් සිට අද දක්වා අපි විවිධ සභාපතිවරුන් ගණනාවක් යටතේ අපි කටයුතු කළා. හිටපු ගරු සභාපති ධර්මසේන බමුණුසිංහ මැතිතුමාගේ කාලයේ යම් යම් හැල හැප්පීම්වලට අපිට මුහුණ දෙන්න සිදු වුණා. අපේ පක්ෂේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කණස්සල්ලට පත් වුණා. මොකද තමන්ගේ අභිමානය රැක ගන්න සභාවෙන් කරන වැඩ ගමට ගෙනියන්න බැරි වූ නිසා. විශේෂයෙන්ම පසුගිය හිටපු සභාපතිවරුන්ට වැඩියෙන් මට ලොකු වගකීමක් තිබෙනවා ඉදිරියේදී සිදුවීමට නියමිත දේශපාලන වෙනස්කම් එක්ක අපිට සභාවේ මන්ත්‍රීවරු සමඟ එකට එක්ව යන්න වෙලා තිබෙන ගමනක් තියෙනවා. ඒ නිසා සියලුම මන්ත්‍රීවරුන්ට බොහෝම ගෞරවයෙන් මතක් කරනවා, ඔබතුමන්ලාගේ සිත් නොරිදා අපේ මන්ත්‍රීවරුන්ගේ සිත් සතුටු කරමින් සියලුදෙනාම එකා වගේ ඉන්න ප්‍රාදේශීය සභාවක් පවත්වාගෙන යන්න මම බලාපොරොත්තු වෙනවා. නමුත් අපේ සභාවේ නිල කාලය 19 වැනිදා අවසන් වීමට නියමිතයි.ඒ නිසා බොහෝ දුරට අද දවස අවුරුදු 5ක ධූර කාලයේ අවසන් දවස වෙන්න පුළුවන්. ඒ

කෙසේ වෙතත් ඉදිරි දවස් 5-6 හෝ කාගෙවත් සිත් නොරිදා වැඩ කරන්න මම බලාපොරොත්තු වෙනවා.

වැඩ බලන ගරු සභාපතිතුමා විසින් 2023.02.14 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

## I. නිවාඩු අනුමත කිරීම.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.ජාබීර් මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## II. 2023.02.16 දින මුදල් කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

2023.02.16 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>**

2023.02.16 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

2023.02.16 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.02.16 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## III. 2023.03.09 දින මුදල් කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

2023.03.09 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)</u>**

2023.03.09 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

2023.03.09 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.03.09 දින මුදල් කමිටුවට සහභාගී නොවූ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## IV.ස්තූතිය පල කිරීම.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, ඩී.එම්.එස්.දිසානායක මහතා විසින් 2023.02.23 දාතමින් ලිපියක් යොමුකර තිබෙනවා. එමගින් ඩී.එම්.එස්.දිසානායක මහතා වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව කුලියාපිටිය ශික්ෂණ රෝහලට ස්ථාන මාරු ලබා ගොස් ඇති බවත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ලෙස සේවය කළ කාලය තුළ පඩුවස්නුවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශය තුළ ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය නැංවීම හා විශේෂයෙන්ම කොරෝනා වසංගතය දැඩිව පැවති ගෙවී ගිය කාලය තුළ අවශ්‍ය වාහන පහසුකම් හා රියදුරු මහතුන් ලබාදීම ඇතුළුව විවිධ අයුරින් අපගේ කාර්ය මණ්ඩලය ලබා දුන් සහයෝගයට ගෞරව පූර්වකව ස්තූතිය පුද කරන බවත් දක්වා තිබේ.

**ඒ අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාගේ ස්තූතිය පළකිරීම වැඩබලන ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.**

## V.බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතියේ අඩුපාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙනි.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

සංවර්ධන නිලධාරි, අජන්තා කුමාරි මහත්මිය විසින් 2023.03.13 දාතමින් අද දින මහා සභාවට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.එමගින් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූලිකත්වයෙන් පවත්වාගෙන යනු ලබන බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය සඳහා යොදවා ඇති මෝටරය අක්‍රිය වීඇති බවත්, මේ හේතුව නිසා ජල පාරිභෝගිකයන් අපහසුතාවයට පත්වී ඇති බවත් දක්වා තිබෙනවා.මේ තත්ත්වය මග හරවා ගැනීම සඳහා එකලා විදුලි පද්ධතියක් මඟින් ක්‍රියාත්මක වෙමින් පවතින විදුලි පද්ධතිය තෙකලා විදුලි පද්ධතියක් බවට පත් කර ගැනීමට යෝජනා කරන අතර එය ක්‍රියාත්මක කිරීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතිය සඳහා තෙකලා විදුලි පද්ධතියක් සවි කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතිය සඳහා තෙකලා විදුලි පද්ධතියක් සවි කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතිය සඳහා තෙකලා විදුලි පද්ධතියක් සවි කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා-

## I. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය ගැසට් පත්‍රයේ පල කිරීම - (විශේෂ යෝජනා)

<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව</u>

**<u>2022 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය</u>**

| | සටහන් | 2022.12.31 | 2021.12.31 |
|---|---|---|---|
| <u>වත්කම්</u> | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 06 | 507485035.00 | 484142621.21 |

| | | | |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| තොග | 07 | 9935387.00 | 5873492.97 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 11825004.00 | 8028818.84 |
| ලැබිය යුතු දෑ | 09 | 137696536.00 | 94996080.67 |
| ආයෝජන | 10 | 45259238.00 | 12615414.77 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 25729039.00 | 24100357.24 |
| | | 230445204.00 | 145614164.49 |
| **මුළු වත්කම්** | | 737930239.00 | 629756785.70 |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 761313.00 | 2957305.55 |
| ජංගම වගකීම් | 13 | 31530694.00 | 50621634.65 |
| හිමිකම් | 14 | 705638232.00 | 576177845.5 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 737930239.00 | 629756785.70 |

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**
එම යෝජනාව මා ස්ථිර කරනවා.
වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති ගිණුමේ ශේෂ පත්‍රය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## II. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභික ධූර කාලය 19 වැනිදා අවසන් වීමට නියමිත බැවින් ගරු මන්ත්‍රී මණ්ඩලයට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා ගැනීම.

වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභික ධූර කාලය 19 වැනිදා අවසන් වීමට නියමිත බැවින් ගරු මන්ත්‍රී මණ්ඩලයට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා ගැනීම සඳහා වූ විශේෂ යෝජනාව සම්බන්ධව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මියට අවස්ථාව ලබා දෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය-(පො.ජ.පෙ.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ අදහස් ඉදිරිපත් කිරීමට සුදුසුම දවස අද කියලා මම හිතනවා. විශේෂයෙන්ම 2018 සිට අවුරුදු 05ක කාලය තුළදී මේ සභාව තුළදී මම නවක සභිකවරියක් විදියට සහභාගී වුණා. මෙතැනට එන්න අවස්ථාව ලබාදුන්, මගේ කොට්ඨාසේ මා පිළිබඳව විශ්වාසය තැබූ 1483ක ඒ ජනතාව මම මතක් කරනවා. දැන් ඉතාම කෙටි කාලයක් තියෙන්නේ. මේ සභා ධුර කාලය තුළ විශේෂයෙන්ම ලේකම්තුමා හා කාර්යය මණ්ඩලයෙන් විශාල සහයෝගයක් අපිට ලැබුණා. ඒ වගේම හිටපු ගරු සභාපතිතුමන් සුනිල් ජයවීර මහතාගේ සභාපතිත්වයෙන් තමා මේ සභාව ආරම්භ වුණේ. එතුමා පිළිබඳව කෘතඥතාවයෙන් වුවත් ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම ධර්මසේන බමුණුසිංහ ගරු සභාපතිතුමන් සමඟත් අපි කටයුතු කළා. ලේකම්තුමා හා කාර්යය මණ්ඩලයටවත් මේ අත්දැකීම නැතුව ඇති. එකම ධුර කාලයකදි සභාපතිවරු 03 ක් යටතේ අපිට කටයුතු කරන්න සිදු වුණා යම් යම් විපර්යාසයන් මත. අපේ අවසන් සභාව දවසේ රංජිත් ආනන්ද බංඩාර ගරු සභාපතිතුමන් යටතේ බිහිවෙන සභාව තුළත් අපි කටයුතු කරනවා. මේ සභාවට ආව දවසේ සිට ඔබ විසින් ලබා දුන් මුදල් යටතේ පාඨමාලාවන් කිහිපයක් හදාරන්න අවස්ථාව ලැබුණා. ඒ වෙනුවෙනුත් මම ස්තූතිය පුද කර සිටිනවා. පළාත් පාලන හා ශ්‍රී ලංකා ආයතන මඟින් පැවැත්වූ පාඨමාලාවන් මඟින් තමයි ඒ දැනුම ලබා ගන්න පුළුවන් වුණේ. අපි මේ සභාව තුළ කටයුතු කරද්දී සිත් රිදීම් සිදු වුණා.ඒ සියල්ල අමතක කරමු. නැවත කිහිප දෙනෙක් හෝ මේ සභාව නියෝජනය කරනු ඇති. ඒ අයට සුබ පතනවා. සභාපතිතුමා කීවා වගේ සෑම කෙනෙකුගේම දේශපාලන අරමුණක් තියෙනවා.ඒ වෙනුවෙන්, තමන්ගේ පක්ෂය වෙනුවෙන් කැප කිරීම් කරනවා. මේ හැමදෙනාටම දේශපාලන ගමන් මඟේ ඉදිරියට යාමට ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. සියලුදෙනාටම සුබ අනාගතයක්.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාර මැණිකා මහත්මිය-(පො.ජ.පෙ.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි.2018 වර්ෂයේ සිට නවක මන්ත්‍රීතුමියක් විදියට මට එන්න අවස්ථාව ලැබුණා.පළමුවෙන්ම අපේ පක්ෂයේ නායකතුමන්ලාට මාව අපේක්ෂිකාවක් වශයෙන් තෝරාපත් කරගැනීම සම්බන්ධව මගේ ගෞරවනීය ස්තූතිය පළ කරනවා වගේම මඟුලාගම කොට්ඨාසේ ඡන්ද 1689ක් ලබාගෙන මා තෝරාපත් කරගැනීම සම්බන්ධව මගේ කොට්ඨාසේ ජනතාවට මගේ හදපිරි ස්තූතිය පුද කර සිටිනවා. ඒ වගේම අපි නවක මන්ත්‍රීවරුන් විදියට මේ සභාවට ආවට පස්සේ බොහෝ අත්දැකීම් ලැබුවා.විවිධ අවස්ථාවල නොයෙක් දුෂ්කරතාවන්ට මුහුණ දුන්නා. හිත් රිදීම් ඇති වුණා. ඊට වඩා බොහෝ සතුටින් වැඩ කළ අවස්ථා අපට තිබුණා. ඒ වගේම අභාවප්‍රාප්ත අපේ හිටපු සුනිල් ජයවීර ගරු සභාපතිතුමා අපේ කොට්ඨාසවල වැඩ කරන්න අපට දිරිය දුන්නා.උදව් කළා.එතුමාගේ සහයෝගය මේ අවස්ථාවේ බොහෝම ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම ගරු සභාපති ධර්මසේන බමුණුසිංහ මහතාගේ කාලයේ අපි වැඩ කළා. අද රංජිත් ආනන්ද මැතිතුමා ගරු සභාපති වුණා. අපිට සභාපතිවරුන් 3කු යටතේ වැඩ කරන්න ලැබීම අපි ලැබූ ලොකු අත්දැකීමක්.ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් හැටියට පත්වුණාට පස්සේ විශාල වැඩ කොටසක් අපේ කොට්ඨාසය වෙනුවෙන් කරන්න පුළුවන් වුණා.අවුරුදු 30ක රාජ්‍ය සේවය කළ මට සභාවට ආවට පස්සේ මහජනතාවට පිං සිදුවෙන වැඩ විශාල කොටසක් කරන්න ලැබුණා. විශේෂයෙන්ම ලේකම්තුමා, කාර්යය මණ්ඩලය අපට බොහෝම සහයෝගය දැක්කුවා. ඒ සඳහා අපේ කෘතවේදී ස්තූතිය පුද කරනවා.අපි මේ සභාව තුළ යම් යම් වචන හුවමාරු ඇති කරගෙන මන්ත්‍රීවරු විදියට පක්ෂ භේද අනුව අපි කොහොම කටයුතු කළත් මේ දොරෙන් එළියට ගියාම අපි ඒ සියල්ල අමතක කරලා අපි සියලුදෙනාම එකාවන්ව වැඩ කළා.ඒ වගේම අපේ ධුර කාලය අදින් අවසන් වුණත් අපි සමු ගන්නේ ඉතාමත් හොඳ සහෝදරත්වයකින්. කවදා වුණත්, කොතැනදී වුණත් නැවත එකතුවෙලා වැඩ කරන්න පුළුවන් විදියටයි අපි මේ දොරෙන් බැහැලා යන්නේ. අපිට මෙතෙක් සභිකවරු විදියට සහයෝගයෙන් වැඩ කරන්න අවස්ථාව හදලා දුන්න හිටපු ගරු සභාපතිවරන්ට, ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට, ගරු මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට, සියලුම කාර්යය මණ්ඩලයට, මාධ්‍යවේදීන්ට මගේ ස්තූතිය පුද කරන අතර සියලුදෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා -(පො.ජ.පෙ.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි.අද සභාවේ අවසන් දිනය කීවත් මට හිතෙන්නේම දීමනා රහිතව තව කාලයක් මෙහි අසුන් ගන්න පුළුවන් කියලාමයි.හෙට්ටිපොල කොට්ඨාසේ ජනතාවට මගේ ගෞරවය හා ස්තූතිය පුද කළ යුතුයි, ජනතාවගේ හෙට්ටිපොල නියෝජිතයා විදියට මාව පත් කළාට. ඒ වගේම මතක් කළ යුතුයි, පළමුවෙන්ම ජොන්ස්ටන් ප්‍රනාන්දු දිස්ත්‍රික් නායකතුමා.වර්තමාන සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමා. එතුමන්ලාගේ පූර්ණ සහයෝගය මත පඬුවස්නුවර

ප්‍රාදේශීය සභාවෙන් කරන කටයුතුවලට එහා ගිය සංවර්ධන කටයුත්තක් මම සිදුකළා. ඒ වගේම හිටපු ගරු සභාපති සුනිල් ජයවීර මහතා ලොකු සහයෝගයක් ලබා දුන්නා අපිට කොට්ඨාස තුළ වැඩ කරන්න.දෛවයේ සරදමක් විදියට එතුමා හදිසියේ අප අතරින් වෙන්වුණා.කෙසේ වෙතත් පහුගිය කාල සීමාව තුළ මගේ කොට්ඨාසයට කිසිම වැඩ කොටසක් කරන්න ලැබුනේ නෑ. මූලාසනේ ඉඳගෙන කොහොම කීවත් සැමට සාධාරණයක් ඉටු කළා කියලා, මම ඉල්ලීම් කළත් මට කිසිම සහයෝගයක් ලබා දුන්නේ නෑ. උදාහරණයක් විදියට මම වීදි පහන් 40කට ආසන්න ප්‍රමාණයක් අලුත්වැඩියා කළේ පසුගිය දවස් දෙකකදී. මේ කටයුත්ත සඳහා මට සහයේගය ලබා දුන් ලේකම්තුමාට හා විදුලි කාර්මික මහත්මාට වගේම වර්තමාන සභාපති ආනන්ද බංඩාර මහතාට. ආදරණීය මන්ත්‍රීවරුන්ට මම මේ කියන්නේ අත්දැකීමෙන්. පාවලා දීම් කරලා කවදාවත් නායකයෝ වෙන්න බෑ.ඒක අද ඔප්පු වෙලා තියෙනවා.කැපවීම් කරලා ඉවසීම් ප්‍රගුණ කරපු ආනන්ද බංඩාර සභාපතිතුමාට එය ඉටු වෙලා තියෙනවා.ඒ නිසා නැවතත් මතක් කරනවා දේශපාලනය කරන අය පාවාදීම්, කුමන්ත්‍රණ නැතුව අපි කැපවෙලා හරියට කළොත් අපිට අවස්ථාව ලැබෙයි.යම් යම් වචන හුවමාරු වීම් වෙලා ඇති.අඩුපාඩුවක්, වරදක් සිදු වුණානම් සිතේ තරහක්, අමනාපයක් තියා නොගෙන සහෝදරත්වයෙන් ඉදිරියේදීත් කටයුතු කරමු.නැවතත් කළගුණ දත් මගේ හෙට්ටිපොල ජනතාවට මගේ ස්තූතිය පුද කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. වසරක 05ක සභා කාලය තුල අවසන් සභාවේ දී දිල්හානි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාවට එතුමියට ස්තූතිවන්ත වෙනවා.2018 පළාත් පාලන මැතිවරණයට බණ්ඩාරකොස්වත්ත කොට්ඨාසෙන් ඉදිරිපත්වෙලා ජාතික ලැයිස්තුවෙන් නිදහස් පක්ෂය වෙනුවෙන් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා.ඒ වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිනවා.ඒ වගේම බණ්ඩාරකොස්වත්ත ජනතාවට මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. මේ කාලය තුළ අපි සභාපතිවරු 03කු සමඟ කටයුතු කළා.අභාවයට පත් සුනිල් ජයවීර මැතිතුමා සමඟ අපි වැඩ කළා. අනතුරුව ඡන්ද විමසීමකින් තේරී පත් වූ බමුණුසිංහ මැතිතුමා සමඟත් අපි කටයුතු කළා. ඒ වගේම හිටපු සභාපති බමුණුසිංහ මැතිතුමාට මේ ධුරය ලැබුණු විදිය මතක් කළ යුතුමයි.එතුමා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් මේ සභාව නියෝජනය කළා.මේ මොහොත වනවිට පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා ලබාදීලා තිබෙනවා.එතුමා දේශපාලන තවත් පක්ෂයක ස්වාධීන අපේක්ෂකයෙකු විදියට නාම යෝජනා ලබාදීලා තිබෙන නිසා පක්ෂයේ තිබෙන ව්‍යවස්ථානුකූලව පක්ෂය ගත් තීන්දුවකට අනුව එතුමා සභාපති ධුරය පසුගිය 07 වෙනිදා ගැසට් පත්‍රයෙන් එතුමාගේ මන්ත්‍රී ධුරයත් එක්කම අහිමි කරලා තිබුණා.ඒක පක්ෂය ගත්තු තීන්දුවක් නිසා සිදුවූ දෙයක් .කෙසේ වෙතත් එතුමා ධුරය දැරූ කාලය තුළ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ අවුරුදු දෙකක- දෙක හමාරක කාලය තුළ සුවිශේෂී වැඩ කටයුතු ප්‍රමාණයක් සිදු කළා.විශේෂයෙන්ම බණ්ඩාරකොස්වත්ත ජල ව්‍යාපෘතිය සිදු කිරීමට විශාල මහන්සියක් කැප කිරීමක් කළා එතුමා.විදුලි අර්පුදයට පිළියමක් ලෙස හෙට්ටිපොල සතිපොළට සූර්ය කෝෂ විදුලි උද්පාදනය පිළිබඳව අවධානය යොමු කරලා ලේකම්තුමා සමඟ කතා කරලා විශාල වැඩ කොටසක් කළා.එය අවසන් අදියරට ඇවිත් තියෙනවා. වීදී පහන් අලුත් වැඩියාව, කාණුකැට දැමීම වැනි අවශ්‍ය පහසුකම් ලබා දීම මෙතුමා කළා. සියලුදෙනාටම සාධාරණ විදියට එතුමා වැඩ කළා.වැඩක් කරපු සභාපතිවරයෙක් විදියට එතුමාව හඳුන්වන්න පුළුවන්.ගරු සභාපතිතුමනි,අද පටන් ඔබතුමා සමඟයි වැඩ කටයතු සිදු කරන්නේ. අදින් සභාව අවසන් වෙයිද, දීර්ඝ වෙයිද හිතා ගන්නත් බෑ. අවසන් වෙයි කියලා හිතාගෙන ඔබතුමා ඉන්නතාක් කල් ෙපර සභාපතිවරු සමඟ වගේම ඉතාම සුහදශීලිව කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ වැඩ කටයුතුවලටත් සහයෝගය දෙන්න. ප්‍රාදේශීය සභාවකින් විය යුත්තේ තම තමන් නියෝජනය කරන කොට්ඨාසවලට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම.ඉතින් ගරු මන්ත්‍රීවරු හැමෙදනා සමඟත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය සමඟ සුහදශීලිව කටයුතු කළා. ඒ හැම දෙනාටමත් ස්තූතිවන්ත වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. 2018 පළාත් පාලන මැතිවරණයෙන් පසු විවිධ පක්ෂ නියෝජනය කරමින් මන්ත්‍රීවරු පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට තේරී පත් වුණා.ඉතින් අපි අනුමාන කරනවා මෙය අවසන් සභාව වෙයි කියලා.2018 අංක 23 දරණ ප්‍රාදේශීය සභා පනතත් සමඟ ඒ වගේම 4300ක් පමණ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ටික වැඩිපුර ප්‍රමාණයක් 8700ක් මේ පනත හරහා සමානුපාතිකව හා කොට්ඨාස ක්‍රමය අනුව කොට්ඨාස ක්‍රමය 60%ක් හා සමානුපාතිකව 40%ක් ලෙස එකතුවෙලා තමා ලංකාව පුරා සභික ප්‍රමාණය පෙර තිබුණු පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 22 සම්මුතිය 38 දක්වා ප්‍රමාණයක් ඇවිත් අද ඒ මැතිවරණ ක්‍රමයෙන් අවසන් වන පලමු සභාව තමයි

මේ. ඒ අනුව ජනතාව බලාපොරොත්තු වුණේ කොට්ඨාස ක්‍රමයෙන් කොට්ඨාසයට වග කියන මන්ත්‍රීවරයෙක්. ඒ අනුව ඉතින් අපිටත් අවස්ථාව ලැබුණා මේ සභාව නියෝජනය කරමින් වැඩ කරන්න. දේශපාලන ක්‍රමයේ යට තියෙන අවසාන පුරුකක් විදියට ප්‍රාදේශීය සභාවේ සභිකවරු විදියට කටයුතු කරන්නේ.ප්‍රදේශයේ ජනතාවට ළඟ ඉඳලා ජනතාවගේ අපේක්ෂා සිතුම් පැතුම් ඉටු කරන්න, ඉහළ දේශපාලන පක්ෂ යාන්ත්‍රණයේ බර අදින්නන් තමයි අපි.කාලෙන් කාලෙට අත්හදා බැලීම් කරන කණ්ඩායමක් විදියට ලක්වෙන්නේ අපි . සමහර වෙලාවල් වලදී ප්‍රතිපාදන වෙන කිරීම්වල සමානුපාතික ක්‍රමයෙන් ආව මන්ත්‍රීවරුන්ට යම් යම් ගැටලු මතු වුණා. නමුත් හිටපු ගරු සභාපති සුනිල් ජයවීර මැතිතුමා මතක් කළ යුතුමයි.එතුමා සමානුපාතික මන්ත්‍රීවරුන්ටත් වැඩ කරන්න අවස්ථා ලබා දුන්නා. ග්‍රාමීය ජනතාවගේ සිතුම් පැතුම් හඳුනගෙන ජනතාවට සේවය කරන්න නැවත වතාවක් අපි නාම යෝජනා ලබා දුන්නා.රටේ තිබෙන තත්ත්වෙත් එක්ක ඡන්දයක් තියයිද නොතියයි ද කියන්න බෑ. මේ ඉන්න අයට නැවතත් මේ සභාව නියෝජනය කරන්න ලැබේවි. කවුරු ආවත් කොහොම ආවත් අපිට අපේ කොට්ඨාසවල වැඩ කරන්න ලැබුණා.පළාත් පාලන ආයතනයක් තුළින් ජනතාව බලාපොරොත්තු වෙන ආකාරයේ වැඩ කටයුතු සිදු කිරීමට අපිට සහයෝගය ලබා දුන් ගරු සභාපතිවරුන්ට ස්තූතියි. ලේකම්තුමා ප්‍රධාන නිලධාරීවරුන්ට ස්තූතියි.සමස්ත කාර්යය මණ්ඩලයටම ස්තූතියි.නැවත වතාවක් ජනතාවට සේවය කිරීමට මේ හැමදෙනාටම ශක්තිය ධෛර්ය වාසනාව ලැබේවා. සියලු දෙනාටම ස්තූතියි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)</u>**

සියලු දෙනාගෙන්ම අවසරයි. අවුරුදු 05 සම්පූර්ණ කරලා අවසන් සභා වාරය මේ පැවැත්වෙන්නේ.මගේ දේශපාලන ගමන් මඟ ගත් විට 2018 වර්ෂයේ මෙම සභාවෙන් කටයුතු ආරම්භ කරන විට හිටියේ සුනිල් ජයවීර ගරු සභාපතිතුමා. මගේ පලුගස්වැව කොට්ඨාසයට ඉමහත් සේවයක් කිරීමට එතුමා සහයෝගය ලබා දුන්නා.ලේකම්තුමා ඇතුලු කාර්යය මණ්ඩලය විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ නිසාම සිංහල මුස්ලිම් ජනතාව තෘප්තිමත්වන ආකාරයට මම සේවය කළා. සුනිල් ජයවීර ගරු සභාපතිතුමාගේ අභාවයෙන් පසු තේරීපත් වුණා ධර්මසේන බමුණුසිංහ ගරු සභාපතිතුමා.බණ්ඩාරකොස්වත්ත පානීය ජල ප්‍රශ්නය ආ වෙලාවේ සභාවේ බවුසර්වලින් දවසකට දහදොළොස් වතාවක් හෙට්ටිපොල සිට බණ්ඩාරකොස්වත්තට අරන් ගියා.මෙයින් සභාවට වන පාඩුව ගැන සිතලා එතුමා දුර කල්පනා කරලා තීන්දුවක් ගත්තා.ලක්ෂ 40ක මුදලක් වෙන් කරලා විශාල ළිඳක් කපලා බණ්ඩාරකොස්වත්ත ජනතාවට පානීය ජල ප්‍රශ්නය විසඳලා දුන්නා.එතුමාගේ දේශපාලන මතය අනුව අද මෙය අත්හැර ගියාට පසුව අද පටන් නව ගරු සභාපති ධුරයට පත් ආනන්ද බණ්ඩාර මැතිතුමාට මගේ සුබ පැතුම් එක් කරනවා.ඒ වගේම පලුගස්වැව සිංහල මුස්ලිම් ජනතාවට මම ස්තූතිවන්ත වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. මම හිතන්නේ මේ අවසාන සභා වාරයයි.අපි වෙනුවෙන් සේවයක් කරන්න,ගමට සේවයක් කරන්න, අපිට සහයෝගය ලබාදුන් ගමේ ජනතාවටත් ඒ වෙනුවෙන් කැප වුණ ගරු සභාපතිවරුන්ටත්, ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් ස්තූති කිරීම අපේ යුතුකමක්. ඇත්තටම දැවැන්ත වැඩසටහන් ගොඩක් කළා මේ කාලය තුළ.නමුත් මෙතැනදි ඇතැම් අය කිව්වා ජනතාවට සේවයක් කරන්න බැරි වුණා කියලා.එහෙම නම් අපි තමයි අඩුවෙන්ම වැඩ කරපු අය.අපි විපක්ෂයේ අයනේ.මේ වෙලාවේ මට මන්ත්‍රීවරයෙක් වෙන්න ඡන්දය දුන්න ජනතාවට මම ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම ස්තූති කළ යුතුයි හිටපු සභාපතිතුමාටත්. මොකද අපිට ගමේ ජනතාවට සේවයක් කරන්න එතුමා ලොකු සහයෝගයක් දුන්නා. එතුමා පක්ෂ පාට භේද නොසලකා වැඩ කළේ. එතුමා සාමූහිකව සියලුදෙනා සමඟ හිත හොඳින් වැඩ කළා.ඉදිරියේදී කුමක්වෙයිද දන්නෑ මේ තියෙන තත්ත්වෙත් එක්ක.මම එ.ජා.ප.යේ කිහිපදෙනෙකුටත් විනය පරීක්ෂණ ඇවිත් තියෙනවා. මට නම් තාම නෑ.2011 වර්ෂයේ ප්‍රබල දේශපාලඥයින් කිහිප දෙනෙක් අභිබවා මම 5 වෙනි තැනට පත්වෙලා ආවේ මම. ඒ වගේම අපි ජනතාවත් එක්ක හිට ගන්න මිනිස්සු. අපි හොඳ දේට හොඳ කියනවා. ඉතින් පසුගිය දවස්වලත් එහෙම කියන්න ගිහින් අපිට ප්‍රශ්න ආවා. අපේ හිත් රිදවීම් වෙලා තියෙනවා.ඒත් අපි ජනතාවගේ පැත්තේ නිසා ඒවා විඳදරාගෙන හිටියා. සමහරු සභාවෙන් දෙන කිසිම දෙයක් නොගෙන ජනතාවට සේවයක් කරන්න දුන් නෑ කියනවා. නමුත් අපි ජනතාවට සේවය කළා.කෙවිටිය කොට්ඨාසේ ජනතාවටත් සියලුදෙනාටමත් මම ස්තූතිය පුද කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. 2011 වර්ෂයේදී තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට තේරී පත් වෙන්නේ. එදා පටන් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවෙන් ලබාදෙන ප්‍රතිපාදන අරන් ආසනය පුරා ජනතාවට දැවැන්ත සේවයක් කළා. ඒ වෙනුවෙන් මට සහය දැක්වූ එදා මෙදාතුර මා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් මට ඡන්දය ලබාදුන් ජනතාවටත් ස්තුති කරනවා.2018 වසරේ දයාසිරි ජයසේකර මැතිතුමාගේ නායකත්වයෙන් කටුක අත්දැකීම් මැද්දෙන් ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න ලැබුණේ.පිහිඹිය කොට්ඨාසේ මන්ත්‍රීවරයෙක් විදියට මම එනවා.ඒ පිළිබඳව නැවත වාරයක් ප්‍රගතිශීලී ජනතාවටත් දයාසිරි ජයසේකර මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. අමිහිරි අත්දැකීම් ලැබූ වසර දෙකක් තුළ මට කරගන්න නොහැකි වූ වැඩ රාශියක් තිබුණා. පිහිඹිය ජනතාව ළඟට යාමට නොහැකි වූ කාලේ ධර්මසේන බමුණුසිංහ හිටපු සභාපතිතුමා විශාල සහයෝගයක් දීලා මට ජනතාවට වැඩ කරන්න සැලැස්සුවා. ඒ ගැන මම කෘතවේදීව සිහිපත් කරනවා.ඒ නිසා මම ජනතාව අතර සුහදතාව වඩාගෙන තියෙනවා. ඒ විශ්වාසය මගේ හිත තුළ තියෙනවා. ඒ පිළිබඳව සතුටුයි.ඒ සඳහා මට තවත් ශක්තියක් වුණා සභාවේ ලේකම්තුමා.විශේෂයෙන්ම අපෙන් යම් යම් අඩුපාඩු ඇතිවෙද්දී, නොපැකිළව හොඳ දේ හොඳයි කියලා නරක දේට නරකයි කියලා පවතින තත්ත්වයට හැඩ ගැහෙන්න අපට සහයෝගය දුන්නා. අපේ හැකියාවන් දියුණු කරගන්න ලේකම්තුමා හැමවිටම සහයෝගය දුන්නා.සමස්ත කාර්යය මණ්ඩලයටත් මම ස්තුතිය පුද කරනවා.ඉදිරියේදී පිහිඹිය කොට්ඨාසයේ සංවර්ධනය වෙනුවෙන් ඔබ සියලුදෙනාගේම සහයෝගයත් මම බලාපොරොත්තු වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි. මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා,අපේ ධුර කාලය නිල වශයෙන් අවසන් වීමට නියමිත බැවින් අවසන් සභා වාරයේ උචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව දිල්හානි ගරු මන්ත්‍රීතුමියට. මේ සභාවට පත්වෙන අවසාන සභිකයාට කලින් ආව සභිකයා තමයි මම.පසුගිය මැතිවරණයේදී ජානක තිලකසිරි මන්ත්‍රීතුමාගේ පක්ෂ මාරුවත් සමඟ තමයි මන්ත්‍රීවරයෙක් විදියට සභාවට එන්නේ.පසුගිය මැතිවරණයේදී පඩුවස්නුවර කොට්ඨාසේ ආදරණීය ජනතාව අප කෙරෙහි විශ්වාසය තියලා ලබා දුන් ඡන්ද ප්‍රතිශතය අනුව තමයි අපි මේ සභාවට එන්නේ. සුනිල් ජයවීර හිටපු සභාපතිතුමා අපිට විශාල ශක්තියක් ලබා දුන්නා පඩුවස්නුවර කොට්ඨාසේ ජනතාවට වැඩ කරන්න.එතුමාටත් ස්තුතිවන්ත වෙනවා.අනතුරුව ධර්මසේන බමුණුසිංහ සභාපතිතුමා පත් වුණාම අපිට පුළුවන් උපරිමයෙන් සහයෝගය දුන්නා අපේ කොට්ඨාස සංවර්ධනය කරන්න. පඩුවස්නුවර කොට්ඨාසේ ජනතාවගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.ඒ වගේම මට වැඩ කටයුතු කරගෙන යාමට සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලැබුනා.සභාව තුළ කටයුතු කරද්දී යම් යම් මතවාද ඇති වුණා. ඒ මොහොතේ සිත් රිදවීමක් ඇති වුණා නම් ඒ වෙනුවෙන් මේ වෙලාවේ මම සමාව භජනය කරන්න කැමතියි. දයාසිරි ජයසේකර මැතිතුමාටත් මේ වෙලාවේ මම ස්තුතිවන්තවෙනවා.අද අපි මෙතැනින් සභා කාලය නිම කරනවා.තම තමන්ගේ කොට්ඨාස නියෝජනය කරන්න නැවතත් මේ මන්ත්‍රීවරුන්ට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම සියලුම දෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

සියලුදෙනාගෙන්ම අවසරයි.අවුරුදු 09කට ආසන්න කාලයක් මේ සභාවේ කටයුතු කරන අතරතුර විවිධ අවස්ථාවල අපි අතර මත ගැටුම් ඇති වුණා. මේ කිසිවෙකුත් සමඟ මට පුද්ගලික ප්‍රශ්නයක් නෑ.මට තිබුණේ දේශපාලන ප්‍රශ්න හා මතවාදයන් පමණයි. මන්ත්‍රීවරු ලෙස අපිව තෝරා පත් කළේ ජනතාව.තව දින කිහිපයකින් අවුරුද්දකින් දික් කරපු කාලයත් අවසන් වී සභාවේ නිල කාලය අවසන් වීමට නියමිතයි. මැතිවරණ සිතියමට අනුව මැතිවරණය අප්‍රේල් 25 තියන්න සූදානම් කරලා තියෙනවා. මැතිවරණයකින් අලුත් සභාවක් තෝරා පත්කරගන්න අවශ්‍යයි. පසුගිය කාලේ සුන්දර කතා මෙන්ම අසුන්දර කතාත් තිබෙනවා.එම අවස්ථා කීපයක් නම් හෙට්ටිපොල පොල අලුතෙන් බෙදන්න ගිහින් වුන සිදුවීම්, නගරයේ ජංගම වෙළඳකුටි අයත් හිමිකරුවන්ට තිබුන ප්‍රශ්න, C වෙළඳ සංකීර්ණයේ ඇති වූ සිදුවීම්, කොරෝනා කාලයේ දී බදු මුදල් බෙදන්න ගිහින් ඇති වූ ප්‍රශ්න, මෑත කාලීනව ගත්තොත් දියුණු කල ප්‍රදේශ ලෙස කාපට් දැමූ පාරවල් නම් කරලා වරිපනම් ගෙවන්න අලුතෙන් සම්මත කරගත්ත යෝජනා වැනි දේවල් ය.ප්‍රාදේශීය සභාව තුළත් දුක්ඛ දෝමනස්සයන්ට පත්වූ අවස්ථාත් තිබුණා.ඒ මතවාද නිසා ඇතිවූ ප්‍රශ්න. වෙනස්ව හිතන මන්ත්‍රීවරු ඉදිරියේ දීවත් මේ සභාව නියෝජනය කරනු ඇති. මැතිවරණය තියලා අලුත් ප්‍රාදේශීය සභාවක වැඩ කරන්න හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා වගේම සුබ පැතුම් එක් කරනවා.

**වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා**

ගරු මන්ත්‍රීතුමනි, අපි සියලුදෙනාම මැතිවරණයට ලෑස්ති වෙලා ඉන්නේ.ඒ වගේම සඳහන් කරනවා කොරෝනා කාලයේ බඩු බෙදීමේ දී ඔබතුමලා ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ඇති කරගත්තට අපිට කරන්න දෙයක් නෑ.හිටපු සභාපති බමුණුසිංහ මැතිතුමා විවිධ සමුපකාර සමිතිය හරහා බඩු මිලදී ගැනීමට යෝජනා කලා. එය රාජ්‍ය ආයතනයක් හෙයින් එයින් මිල ගනන් ගැනීමක් කරන්න අවශ්‍ය නෑ. ඒ නිසා අපි නිසියාකාරව එහි දී බඩු මිලදී ගත්තේ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා - (පො.ජ.පෙ.)**

සියලුදෙනාගෙන්ම අවසරයි. අපට ස්තූතිය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මම පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා. කියන්න කණගාටුයි, මම මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත්වෙලා ආවට පසුව පසුගිය අවුරුදු 1 ½ තුල අපිට කිසිම දෙයක් සභාව තුලින් ලැබුනේ නෑ.මම ඒ ගැන බොහෝම කනගාටු වෙනවා.සුනිල් ජයවීර මහතා සභාපති වී සිටි අවුරුදු 2 ½ ක කාලය තුල අපි අපේ කොට්ඨාසය තුල වැඩකටයුතු රාශියක් සිදුකලා. බමුණුසිංහ සභාපතිතුමාගේ කාලය තුල අමිල නිශාන්ත මන්ත්‍රීතුමාගේ පිරිසට කිසිදෙයක් සභාව තුලින් ලැබුනේ නෑ කියලා මම අවිවාදයෙන් කියනවා. නමුත් නවක මන්ත්‍රීවරුන් වශයෙන් අපි සභාවට ආපු වෙලාවේ නීතිරීති කිසිමදෙයක් දන්නේ නෑ. අපිට ඒ මොහොතේ ගරු ලේකම්තුමා බොහෝ දේවල් කියලා දුන්නා. විශේෂයෙන් සියලුම කාර්ය මණ්ඩලයෙනුත් ලොකු සහයෝගයක් ලැබුනා. මගේ කොට්ඨාසය තුල ජනතාවට මේ කාලය තුල ලොකු වැඩක් කරන්න ලැබුනේ නෑ.මගෙන් වැරද්දක් සිදුවුනා නම් සියලු දෙනාගෙන් ම සමාව අයද සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**

සියලුදෙනාගෙන්ම අවසරයි. අවසාන සභා වාරයේ දී අපිට ස්තූතියක් කරන්න අවකාශ ලබාදීම පිළිබඳ සද්නා දිල්හානි මන්ත්‍රීතුමියට ස්තූතිවන්ත වෙනවා.අභිනවයෙන් සභාපති ධූරයට පත්වුනු රංජිත් ආනන්ද මැතිතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම් නායකයා විදියට මාගේ සුභාසිංශනය ප්‍රාර්ථනා කරනවා.අපේ ධූරකාලය අවසන් වෙන මේ මොහොතේ දී අවුරුදු 5ක කාලය ඇතුලත සභාපතිවරුන් තුන්දෙනෙක් යටතේ කටයුතු කලා. විශේෂයෙන්ම පළමුවෙන්ම සුනන්දපුර කොට්ඨාසයේ ආදරණීය ජනතාවට ස්තූතිවන්ත වෙන්න ඕනි කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ම මාව මන්ත්‍රීවරයෙක් වශයෙන් තෝරාපත් කිරීම ගැන. සුනිල් ජයවීර සභාපතිතුමා මෙතැන නොසිටියත් එතුමාගේ අභාවය පිළිබඳ අපි දැඩි සේ දුක්වුනා. එතුමාගේ කාලයේ මම විපක්ෂයේ සිටියත් අන් සියලු මන්ත්‍රීවරුන්ට වඩා වැඩි වැඩ කටයුතු රාශියක් මම ඉටුකලා. සුනන්දපුර කොට්ඨාසයට මම බොහෝ වැඩ කටයුතු කරා. මම හිතන විදියට බමුණුසිංහ මන්ත්‍රීතුමා සිටි කාලයේ වැඩියෙන්ම වැඩ අරගෙන තියෙන්නේ සුනන්දපුර කොට්ඨාසයෙන්.ඒක මගේ දක්ෂතාවය.කේලම් කියලා නෙවෙයි.කථා බහ කරලා සුහදත්වයෙන් ඉදලා තමයි මං කටයුතු කලේ.බමුණුසිංහ මැතිතුමා මෙතන නොසිටියත් එතුමාට ස්තූතිවන්ත කරන්න ඕනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායක දයාසිරි ජයසේකර මැතිතුමා ඇතුළු අප පක්ෂයේ සියලු දෙනාගේ ප්‍රණාමය රංජිත් ආනන්ද ගරු සභාපතිතුමාට පුද කරසිටිනවා. තවද අවවාද අනුශාසනා ලබාදෙමින් අපට ශක්තියක් ලබාදුන් ලේකම්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**

සියලුදෙනාගෙන්ම අවසරයි. මම මුලින්ම මට මන්ත්‍රී ධූරයක් ලබාදුන්නට අපේ පක්ෂ නායක තුෂාර ඉඳුනිල් මැතිතුමාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. තිස්සව කොට්ඨාසයේ මන්ත්‍රීවරියක් වශයෙන් ලොකු වැඩ කොටසක් කිරීමට මට අවකාශය ලැබුණා. මේ වන විට වෛද්‍ය ආධාර, කාණු කැට,වැසිකිළි ආධාර, වීදි පහන් මෙන්ම මාර්ග බොහෝ ප්‍රමාණයක් මෝටර් ග්‍රේඩර් කිරීමට අවස්ථාව ලැබුනා. මට පසුගිය අවුරුද්දේ වෛද්‍ය ආධාර ලබාදෙන්න නොහැකි වුනු පවුලකට නිමල් දයානන්ද මන්ත්‍රීතුමා විසින් එතුමාගේ වෛද්‍ය ආධාරය එම පවුලට ලබාදෙන්නට මට අවස්ථාව සලසා දුන්නා. එතුමාට මාගේ කෘතවේදීත්වය පල කර සිටිනවා. මේ මගේ අවසාන සභා වාරය.විශේෂයෙන් ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම්තුමාට ස්තුති කරන්න ඕනි. ඒ වගේම කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙක් මට උදව් කරා. ඒ අයවත් කෘතවේදීව සිහිපත් කර සිටින අතර ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (පො.ජ.පෙ.)**

සියලු දෙනාගෙන්ම අවසරයි. 2006 වර්ෂයේදී පළාත් පාලන මැතිවරණයේ එවකට තිබූ මැතිවරණ ක්‍රමය අනුව තමයි මුලින්ම මමත් ආනන්ද සභාපතිතුමාත් සමකාලීන මන්ත්‍රීවරුන් වශයෙන් මේ සභාව නියෝජනය කලේ. අපි දෙන්නා සභාපතිවරුන් 4 දෙනෙක් යටතේ හිටියා.අපි බොහෝම සතුටින් ආදරෙන් කටයුතු කලා. අපි ස්තුතිවන්ත වෙන්න ඕනි වසර 15කට අධික කාලයක් පඩුවස්නුවර ජනතාව මෙතෙක් කල් අපිව විශ්වාස කරලා මන්ත්‍රීධූරයේ කටයුතු කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව. තවද පසුගිය මැතිවරණ ක්‍රමය කොට්ඨාස ක්‍රමයට පැවැත්වුයේ.මම රත්මල්ල කොට්ඨාසයෙන් ඉදිරිපත් වුනේ. 55%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන මාව රත්මල්ලේ කොට්ඨාසයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් තෝරාපත්කරගත්තාට එම කොට්ඨාසයේ ආදරණීය ජනතාවට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා.අපි පළාත් පාලන මන්ත්‍රීවරන් විදියට මේ සභාව තුල තීන්දු තීරණ ගත්තත් ඒවා අපිට ක්‍රියාත්මක කිරීමට අපේ ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය දැවැන්ත කාර්ය භාරයක් කලා.අපි අතර මහජන නියෝජිතයින් නිලධාරීන් අතර තියෙන සම්බන්ධයකට එහා ගිය සහෝදර බැඳීමක් තිබුනා.ඉතින් මේ අවස්ථාවක් කරනවා ඒ සියලු දෙනාට ස්තුතිය පුද කර සිටින්න. තවද අද ජීවතුන් අතර නොසිටියත් හිටපු ගරු සභාපති සුනිල් ජයවීර මහතා ගැන සඳහන් කරන්න ඕනි. මම එතුමා ගැන කොතනකදීවත් විවේචනයක් සිදුකරලා නෑ.ඒක මගේ ප්‍රතිපත්තියක්. ධර්මසිරි දසනායක මැතිතුමාගෙන් තමයි මම මුලින්ම දේශපාලනයට පිවිසෙන්නේ. ඒ වගේම ඉන්දික බණ්ඩාරනායක මැතිතුමා,රත්නායක මැතිතුමා සමඟ දේශපාලනයට ප්‍රවිශ්ට වෙලා ඔවුන්ගේ හිත් දිනා ගනිමින් වැඩ කටයුතු කලා. ඒ වගේම බමුණුසිංහ ගරු සභාපතිතුමා සිහිපත් කරන්න ඕනි.එතුමා අපේ පක්ෂයේ සිටි ජේෂ්ඨ නායකයෙක්.එතුමා අපේ පක්ෂයේ බලය ඉදිරියට ගෙන්න ඇප කැප වුනු පුද්ගලයෙක්. ඒ වගේම අපේ මාධ්‍ය නිලධාරි මහතුන් සිහිපත් කරන්න ඕනි.අපේ මතය ලෝකයට අරගෙන ගියේ ඔබලා.රටට අපේ මතය අරගෙන යන්න කැපවුනු මාධ්‍ය නිලධාරි ඔබටත් ස්තුති කරනවා.

**වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා**

මුලින්ම සද්නා දිල්හානි මන්ත්‍රිතුමියට මේ යෝජනාව ගෙන ආවට ස්තුතිවන්ත වෙනවා.ලේකම් තුමා අපිට ලොකු සහයෝගයක් ලබාදුන්නා.ඒ වගේම කාර්ය මණ්ඩලයත් අපිට ලබාදුන්න සහයෝගයට මම ස්තුති කරනවා.සමහර මන්ත්‍රීවරුන්ගේ හිත් අමනාපකම් ඇතිවෙන්න ඇති.ඉතින් ඒවා අමතක කරලා අපි ඉදිරියටත් නැවත මේ සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.තරුණයන්ගේ ඔලුවල තියෙන කුහකත්වය ඊර්ෂ්‍යාව තරහව ඔවුන්ගේ හිත්වල ඇති නොකර විනය ගරුක දේශපාලනයක් කරන්න ලැබෙන්න කියලත් ප්‍රාර්ථනා කරනවා.

වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ධූර කාලය අවසන් කරන සභිකවරුන් හා සභිකවරියන්ට යම් කිසි අදහස් දැක්වීමකට අවස්ථාව ලබාගැනීමේ විශේෂ යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ධූර කාලය අවසන් කරන සභිකවරුන් හා සභිකවරියන්ට යම් කිසි අදහස් දැක්වීමකට අවස්ථාව ලබාගැනීමේ විශේෂ යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

**06. කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**I.2023.02.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා, පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා
2023.02.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)**
2023.02.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)**
2023.02.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා
2023.02.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.02.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම,නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**I. 2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**
**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2474152.13 | 1415982.12 | 1276455.83 | 42710.00 | 131405.91 | 3506006.74 | 8846712.73 |
| 2 | ගමන් වියදම් | 191250.00 | 1750.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 193000.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 516500.00 | 699871.80 | 506640.00 | 6560.00 | 0.00 | 47100.00 | 1776671.80 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 338275.00 | 449676.00 | 38087.00 | 0.00 | 1024160.00 | 18000.00 | 1868198.00 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 141456.89 | 21841.01 | 7980.00 | 90939.29 | 111750.00 | 15740.75 | 389707.94 |
| 6 | පොළී ගෙවීම්,ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් , දායක මුදල් හා සහනාධාර | 0.00 | 5535.00 | 0.00 | 0.00 | 0.00 | 97760.00 | 103295.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 49015.32 | 0.00 | 0.00 | 0.00 | 12253.82 | 61269.14 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **3661634.02** | **2643671.25** | **1829162.83** | **140209.29** | **1267315.91** | **3696861.31** | **13238854.61** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 42701.28 | 42701.28 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | ප්‍රාග්ධන වැය එකතුව | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **42701.28** | **42701.28** |
| | පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධන වැය එකතුව | **3661634.02** | **2643671.25** | **1829162.83** | **140209.29** | **1267315.91** | **3739562.59** | **13281555.89** |
| | තැන්පත් | 811996.71 | | | | | | 811996.71 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 22500.00 | | | | | | 22500.00 |
| | අත්තිකාරම් | 68769.42 | | | | | | 68769.42 |
| | ණයහිමි | 4104185.59 | | | | | | 4104185.59 |
| | සමුච්චිත අරමුදල | 2000.00 | | | | | | 2000.00 |
| | ආයෝජන | 2918058.37 | | | | | | 2918058.37 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **7927510.09** | | | | | | **21209065.98** |

**<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාරමැණිකා මහත්මිය - (පො.ජ.පෙ.)</u>**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 39015.49 | 191600.00 | - | - | - | 27000.00 | 257615.49 |
| 20 කුලී | - | - | 1067475.00 | - | 2251669.05 | 174250.00 | 3493394.05 |
| 30 බලපත්‍ර ගාස්තු | 25.00 | 119150.00 | - | - | - | 2200.00 | 121375.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 422565.00 | 373861.00 | 0.00 | - | 2935.00 | 799361.00 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 15830.00 | 0.00 | 2610.00 | 0.00 | 18440.00 |
| 60 වෙනත් ආදායම් | 193189.71 | 78020.00 | 0.00 | 142641.00 | 0.00 | 360.00 | 414210.71 |
| 70 වෙනත් ආධාර | 585000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 585000.00 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **817230.20** | **811335.00** | **1457166.00** | **142641.00** | **2254279.05** | **206745.00** | **5689396.25** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව | **817230.20** | **811335.00** | **1457166.00** | **142641.00** | **2254279.05** | **206745.00** | **5689396.25** |
| තැන්පත් | 192180.00 | | | | | | 192180.00 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 24640.00 | | | | | | 24640.00 |
| සේවක ණය | 332143.50 | | | | | | 332143.50 |
| අත්තිකාරම් | 43055.00 | | | | | | 43055.00 |
| ණය ගැති | 13880.00 | | | | | | 13880.00 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 2762526.25 | | | | | | 2762526.25 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 7618.55 | | | | | | 7618.55 |
| **මුළු එකතුව** | **3376043.30** | | | | | | **9065439.55** |

**වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බණ්ඩාරමැණිකා මහත්මිය - (පො.ජ.පෙ.)**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා**
2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ **ලැබීම්** සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2023 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

## උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4<br>(1+3) | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7<br>( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10<br>4 - (5+6) | ඉදිරියට ලැබීම්<br>11<br>(7+8) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 96560.09 | 0.00 | 0.00 | 37455.49 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 0.00 | 7303.66 | 0.00 | 0.00 | 1560.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | කඩ කුලී 3/22 | 269600.00 | 46682.20 | 832100.00 | 1101700.00 | 866575.00 | 37782.20 | 8900.00 | 48857.20 | 10000.00 | 246200.00 | 57757.20 |
| 4 | වත්කම් බදු 5/23 | 1536436.05 | 33960.00 | 1541486.05 | 3077922.10 | 1566289.05 | 10230.00 | 23730.00 | 70583.00 | 0.00 | 1571986.05 | 94313.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 150117.39 | 8588.80 | 53496.00 | 203613.39 | 138246.00 | 1652.00 | 4296.00 | 7791.00 | 3380.00 | 67626.39 | 12087.00 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 186600.00 | 186600.00 | 186600.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 2000.00 | 2000.00 | 2000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 119150 | 119150 | 119150 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු 2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | ඇතැම් ව්‍යාපාර බදු2/16/3 | 0 | 0 | 3000.00 | 3000.00 | 3000.00 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 10 | එකතුව | 1956153.44 | 193094.75 | 2737832.05 | 4693985.49 | 2920875.54 | 49664.20 | 36926.00 | 127231.20 | 13380.00 | 1885812.44 | 164157.20 |

**<u>වැඩබලන ගරු සභාපති  රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**

2023 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාරමැණිකා මහත්මිය - (පො.ජ.පෙ.)</u>**

2023 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

2023 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>වැඩබලන ගරු සභාපති  රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**

2023 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. 2023 අප්‍රේල් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව.

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2023 ජනවාරි. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 448000 | 150000 | 598000 | 821024.14 | 37455.49 | 858479.63 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 16000 | 3000 | 19000 | 5650 | 1560 | 7210 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 250 | 50 | 300 | 0 | 0 | 0 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 50000 | 0 | 50000 | 7000 | 2000 | 9000 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 1000 | 0 | 1000 | 0 | 3000 | 3000 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 2000000 | 0 | 2000000 | 500400 | 186600 | 687000 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 1360000 | 5000 | 1365000 | 334750 | 119150 | 453900 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 100000 | 0 | 100000 | 0 | 0 | 0 | | 0 | 0 |
| කඩ කුලී ( 3/22 ) | 8850000 | 0 | 8850000 | 2212500 | 737500 | 2950000 | 761625 | 866575 | 1628200 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 282000 | 0 | 282000 | 282000 | 0 | 282000 | 270600 | 19800 | 290400 |
| රථගාල් ගාස්තු(3/43/3) | 200000 | 0 | 200000 | 60000 | 20000 | 80000 | 8400 | 6000 | 14400 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 1449000 | 483000 | 1932000 | 48557 | 138246 | 186803 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 2280000 | 850000 | 3130000 | 835570 | 685380 | 1520950 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 1642910 | 821455 | 2464365 | 188180 | 1566289.05 | 1754469.05 |
| සතිපොල බහු.කාර්.ගොඩ | 200000 | | 200000 | 46000 | 15000 | 61000 | 0 | 0 | 0 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 82500 | 37500 | 120000 | 104250 | 27000 | 131250 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 34500 | 11000 | 45500 | 26500 | 0 | 26500 |
| එකතුව | 37963535 | 0 | 37963535 | 11964660 | 3133505 | 15098165 | 3912506.14 | 19010671.14 | 22923177.28 |

**<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**

2023 අප්‍රේල් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාරමැණිකා මහත්මිය - (පො.ජ.පෙ.)</u>**

2023 අප්‍රේල් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

2023 අප්‍රේල් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා</u>**

2023 අප්‍රේල් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 අප්‍රේල් මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2023 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව
## උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය /ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 112408605.00 | - | 112408605.00 | 9367383.75 | 9367383.75 | 18734767.50 | 8064104.57 | 8846712.73 | 16910817.30 | 1823950.20 |
| 2 | ගමන් වියදම් | 1074000.00 | - | 1074000.00 | 100000.00 | 70000.00 | 170000.00 | | 193000.00 | 193000.00 | (23000.00) |
| 3 | සැපයුම් හා උපකරණ | 15783000.00 | - | 15783000.00 | 400000.00 | 500000.00 | 900000.00 | 1289575.00 | 1776671.80 | 3066246.80 | (2166246.80) |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 18027500.00 | - | 18027500.00 | 1800000.00 | 350000.00 | 2150000.00 | - | 1868198.00 | 1868198.00 | 281802.00 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 13571000.00 | - | 13571000.00 | 800000.00 | 900000.00 | 1700000.00 | 3105.00 | 389707.94 | 392812.94 | 1307187.06 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 33428.00 | - | 33428.00 | 1835.22 | 1745.84 | 3581.06 | - | - | - | 3581.06 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 7963000.00 | - | 7963000.00 | 400000.00 | 400000.00 | 800000.00 | 16860.00 | 103295.00 | 120155.00 | 679845.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 1055836.00 | - | 1055836.00 | 67000.00 | 80000.00 | 147000.00 | - | 61269.14 | 61269.14 | 85730.86 |
| 9 | උපකරණ වැය | 33650000.00 | - | 33650000.00 | 3000000.00 | 2500000.00 | 5500000.00 | - | 42701.28 | 42701.28 | 5457298.72 |
| 10 | ණය ආපසු ගෙවීම් | 667424.00 | - | 667424.00 | 12046.34 | 12136.69 | 24183.03 | - | | - | 24183.03 |
| | **එකතුව** | 204233793.00 | - | 204233793.00 | 15948265.31 | 14181266.28 | 30129531.59 | 9373644.57 | 13281555.89 | 22655200.46 | 7474331.13 |

**වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා**

2023 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බණ්ඩාරමැණිකා මහත්මිය - (පො.ජ.පෙ.)**

2023 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**

2023 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**වැඩබලන ගරු සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා**

2023 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

### 08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් , 2023 වර්ෂයේ මාර්තු මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.12.25 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කළේ -ඩබ්.එම්.එන්.ප්‍රියදර්ශනී, සංවර්ධන නිලධාරී.
වාර්තා කළේ -එච්.ඒ. ජී.නිශ්ශංක, ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව